ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Pradeshiya Sanwardhana Bank

දිනය:-2025.10.17

ටෙන්ඩර් අංක :- RDB/RGM/SB/Pro/Admin/2025/39

කලමනාකරු
EWIS පෙරිපෙරල්ස් පුද්ගලික සමාගම
යතමා බිල්ඩින්
නො.142 ගාලුපාර
කොළඹ 03.

EWIS PERIPHERALS (PVT) LTD.
34 22 OCT 2025
RECEIVED

මහත්මයානනි,

**මිළ ගණන් කැඳවීමයි.**

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සබරගමුව පලාතේ ශාඛා/කාර්යාල වලට අවශ්‍ය 19.5" Led Monitors (HDMI + VGA) මිලදී ගැනීමට අදහස් කරන අතර ඒ සඳහා සේවා සපයන ආයතන වෙතින් මිළ ගණන් කැඳවනු ලබයි.

ඔබ ආයතනය ඉදිරිපත් කරන මිල ගණන් පහත සඳහන් කොන්දේසි සහ නියමයන් වලට අනුකූලව ඉදිරිපත් කල යුතුය.

1. මිළ ගණන් බදු රහිතව ඉදිරිපත් කල යුතුය. (වැට් හෝ වෙනත් බදු සඳහා ලියාපදිංචිය ලබා ඇත්නම් එහි අංක සඳහන් කල යුතුය.)

2 ප්‍රවාහන ගාස්තු ඇතුලත් නම් එයට අනුකූල වන පරිදි ඔබ ආයතනයේ මිළ ගණන් ඉදිරිපත් කිරීම කල යුතු වන අතර, පසුව ඒ සඳහා ආදේශ කිරීම් කල නොහැක.

3. ඇණවුමක් (Perchase Order) මගින් මිලදී ගැනීමට අපේක්ෂාකරන උපාංග (Monitors) අවම වශයෙන් සති 02 ක (දින 14) කාලසීමාවක් තුලදී පහත සඳහන් ලිපිනයේ වූ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සබරගමුව පලාත් මෙහෙයුම් අංශය වෙත ප්‍රවාහනය කර නිසි පරිදි භාරදීම හෝ තැපැල් දූත සේවාවක් මගින් ලැබීමට සැලැස්විය යුතුය.

4. මෙම මිළ කැඳවීමට අදාල ප්‍රසම්පාදන කටයුත්ත සම්බන්ධයෙන් තීරණ ගැනීමේ අයිතිය බැංකුව සතුවන අතර, එම තීරණය අවසාන තීරණය වේ. මෙහි ඇතුලත් කොන්දේසි/නියමයන් වලට අනුකූලව ඔබ ආයතනයෙහි/සමාගමෙහි මිළ ගණන් ඉදිරිපත් කල යුතු අතර, ඒ සඳහා යොමුකර ඇති ලංසු ආකෘතිය භාවිතා කිරීමේ හැකියාව ඇත. නොඑසේනම් එම ආකෘතියට අනුවම සකස් කර ගන්නා ලද ඔබ ආයතනයේ/සමාගමේ ලිපි ශීර්ෂයක් හෝ වෙනත් සුදුසු කඩදාසියක් භාවිතා කිරීමේ හැකියාව පවතින නමුත් එය අදාල ආකෘතියට අනුවම පැවැතීම අනිවාර්යවේ. කිසිවිටකත් එහි ඇතුලත් පිරිවිතර වෙනස් කිරීම හෝ විකෘති කිරීම නොකල යුතු අතර එවැන්නක් සිදුකර ඇති බව තහවුරු වන ලංසු පත්‍ර ප්‍රතික්ෂේප කිරීම හෝ ඇගයීමෙන් ඉවත් කිරීම සිදුකරනු ලබයි.

( P.T.O )